කෘෂි හා ආහාර තාක්ෂණය

10 ශ්‍රේණිය

A.K.H.කුලරත්න

ගුරු උපදේශක(කෘෂිවිද්‍යා)

කලාප අධ්‍යාපන කාර්යාලය

හොරණ

ශාක පෝෂක

ශාක වර්ධනය හා පැවැත්ම සඳහා අවශ්‍ය මූලද්‍රව්‍ය වේ .

ශාක පෝෂණය

බෝග වලින් අපේක්ෂිත අස්වනු ලබා ගැනීම සඳහා ඌනතාවයකින් තොරව නිසි අයුරින් පෝෂක ලබාදීම ශාක පෝෂණයයි.

අත්‍යාවශ්‍ය පෝෂක

ශාක වර්ධනය හා පැවැත්ම සඳහා සෘජුව බලපාන පෝෂක අත්‍යාවශ්‍ය පෝෂක වේ.

අත්‍යාවශ්‍ය පෝෂක 16කි .

එම අත්‍යාවශ්‍ය පෝෂක කොටස් දෙකකි.

1. මහා පෝෂක
2. ක්ෂුද්‍ර පෝෂක

මහා පෝෂක 09

කාබන්	(C)
හයිඩ්‍රජන්	(H)
ඔක්සිජන්	(O)
නයිට්‍රජන්	(N)
පොස්පරස්	(P)
පොටෑසියම්	(K)
කැල්සියම්	(Ca)
මැග්නීසියම්	(Mg)
සල්ෆර්	(S)

ක්ෂුද්‍ර පෝෂක 07

සින්ක්	(Zn)
කොපර්	(Cu)
මැංගනීස්	(Mn)
මොලිබ්ඩිනම්	(Mo)
බෝරෝන්	(B)
යකඩ	(Fe)
ක්ලෝරීන්	(Cl)

• බෝග ශාක පෝෂක ලබා ගන්නේ වායුගෝලයෙන් හෝ පසෙන් ය.

වායුගෝලයෙන්

කාබන් (C)
ඔක්සිජන් (O)



පසෙන්

හයිඩ්‍රජන් (H)
නයිට්‍රජන් (N)
පොස්පරස් (P)
පොටෑසියම් (K)
කැල්සියම් (Ca)
මැග්නීසියම් (Mg)
සල්ෆර් (S)

සින්ක් (Zn)
කොපර් (Cu)
මැංගනිස් (Mn)
මොලිබ්ඩිනම් (Mo)
බෝරෝන් (B)
යකඩ (Fe)
ක්ලෝරීන් (Cl)

වඩාත්ම වැදගත් මහා පෝෂක
නයිට්‍රජන් (N)
පොස්පරස් (P)
පොටෑසියම් (K)

පෝෂකය	නයිට්‍රජන් (N)
වැදත්කම	ශාක වර්ධනයට ඇමයිනෝ අම්ල ,එන්සයිම,හරිතප්‍රද නිෂ්පාදනය ට
ඌනතා ලක්ෂණ	මේරූ පත්‍ර කහ පාට වීම ශාක කුරුවීම අස්වැන්න අඩුවීම

පෝෂකය	පොස්පරස් (P)
වැදත්කම	මුල පද්ධතිය වර්ධනයට සෛල විභාජනයට
ඌනතා ලක්ෂණ	මුල මණ්ඩලය දුර්වලවීම මේරූ පත්‍ර දම් පාට වීම

පෝෂකය	පොටෑසියම් (K)
වැදත්කම	පුෂ්පිකරණය ට ඵල හටගැනීමට පටක වර්ධනයට
ඌනතා ලක්ෂණ	පත්‍ර දාර පළමුව කහ පැහැ වී පසුව පිළිස්සුනු ස්වභාවයක් ගැනීම

පොහොර

- ශාක පෝෂණය සදහා ලබාදෙන ද්‍රව්‍ය පොහොර නම් වේ.
- ශාක පෝෂණයේ දී ලබා දෙන පොහොර ආකාර දෙකකි.

1. කාබනික පොහොර

2.රසායනික පොහොර

කාබනික පොහොර

පෝෂණය ලබා දීමේ අරමුණ ඇතිව බෝගවලට යොදන ජෛවීය සම්භවයක් (ශාක/සත්ව) ඇති සියලු ද්‍රව්‍ය කාබනික පොහොර ලෙස හැඳින්වේ

කාබනික පොහොර වර්ග

- කොළ පොහොර
- සත්ත්ව පොහොර
- කොම්පෝස්ට් පොහොර
- දියර පොහොර

කොළ පොහොර

බෝග වගාවේදී පෝෂක ලබාදීම පිණිස පසට එකතු කරන හරිත ශාක කොටස්ය.

කොළ පොහොර යොදන ක්‍රම

1.පිටතින් ගෙනවිත් ක්ෂේත්‍රයට දැමීම

බහුලව වැවී ඇති ස්ථානයකින කපා ගෙනවිත් ක්ෂේත්‍රයට දැමීම

2.වගා බිමේ වගා කර පසට යෙදීම

එක වගා කන්නයක් අවසන් කර අනෙක් කන්නය පටන් ගන්නා තෙක් කාලයේදී වගාකර සිසෑමේදී පසට යට කරයි.

❑කොළ පොහොර ලෙස වඩා සුදුසු රනිල ශාක පත්‍ර ය .

ඒවායේ නයිට්‍රජන් බහුල වේ .

සත්ත්ව පොහොර

ගොවිපල සතුන්ගේ මළ මූත්‍රා හා අනෙකුත් සත්ත්ව ගොවිපල අවශේෂ සත්ත්ව පොහොර ලෙස හැදින්වේ.

සත්ත්ව මල ද්‍රව්‍ය -ගොම ,කුකුළු පොහොර ,එළු පොහොර .....

සත්ව නිෂ්පාදන අපද්‍රව්‍ය - සත්ව ඇටකටු (කටු පොහොර

කොම්පෝස්ට් පොහොර

ශාක හා සත්ව අවශේෂ ක්ෂුද්‍රජීවින් මගින් අර්ධ වශයෙන් වියෝජනයට ලක්වීමෙන් ලැබෙන ද්‍රව්‍ය කොම්පෝස්ට් ලෙස හැදින්වේ.

කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රම

1.ගොඩ ක්‍රමය

2.වල ක්‍රමය

3.ජීව කොටු ක්‍රමය

4.බැරල් ක්‍රමය

කොම්පෝස්ට් නිෂ්පාදනයේ පියවර (ගොඩ ක්‍රමය හා වල ක්‍රමය)

1 .සුදුසු ස්ථානයක් තෝරා ගැනීම

- නිවාස හා ළිං වලින් ඈත්ව පිහිටීම .

- අමුද්‍රව්‍ය සපයා ගැනීම පහසු වීම .

- ජල පහසුව.

- ප්‍රවාහන පහසුව .

ජලවහනය දියුණු වීම (වර්ෂා කාලයේ දී ජලයෙන් යට නොවීම)

2.අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම

- යොදා ගැනීමට සුදුසු ද්‍රව්‍ය -
- ශාක පත්‍ර ජලජ පැළෑටි තෘණ පිදුරු

බෝග අවශේෂ සත්ත්ව මළ ද්‍රව්‍ය මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය

- විශාල ශාක කොටස් කුඩාවට කපා ගත යුතුය.

- යොදා ගැනීමට නුසුදුසු ද්‍රව්‍ය -
- පොල්කටු පොල්ලෙලි කඩදාසි ලිකුඩු දැව අළු

3. සුදුසු කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීම

ගොඩ ක්‍රමය

තෙත් කලාපයට වඩාත් සුදුසුයි.

වාණිජ වශයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනයට සුදුසු ය.

ගල් බොරළු ආදිය ඉවත් කර පොළොව මට්ටම් කරයි .

පස බුරුල් නම් පෝෂක පස තුලට කාන්දුවන නිසා

පස තලා තද කල යුතුය

වල ක්‍රමය

වියලි කලාපයට වඩාත් සුදුසු ය.

මහා පරිමාණව කිරීම අපහසු ය.

ජලවහනය දුර්වල ස්ථාන සඳහා නුසුදුසු ය.

එතරම් ජනප්‍රිය නොවේ.

තෝරාගත් ස්ථානයේ 2 m දිග 1 m පළල 75 cm ගැඹුර වලක් සකස් කරයි.

4 .අමුද්‍රව්‍ය ඇසිරීම

- 15 cm පමණ උස තට්ටු ලෙස ද්‍රව්‍ය ඇසිරීම කරයි.

- අමුද්‍රව්‍ය තට්ටුව මතට මුහුම් ලෙස පැරණි කොම්පෝස්ට් ස්වල්පයක් විසුරුවයි.

- පහළම ස්තරයට යොදන්නේ ශාක ද්‍රව්‍යයි.

- ගොඩ ක්‍රමයේ දී කොම්පෝස්ට් ගොඩේ උපරිම දිග 5 m,පළල 1.8 m වේ.

- වල ක්‍රමයේ දී කොම්පෝස්ට් මිශ්‍ර කිරීම සඳහා වලෙහි කොටසක් හිස්ව තබයි.

- අමුද්‍රව්‍ය ගොඩ ගැසූ පසුව කළු පොලිතින් හෝ පොලිසැක් උර වලින් හොඳින් ආවරණය කල යුතුය



රිට
තෘණ
මතුපිට පස් ආවරණය
අළු
ශාක පත්‍ර
මතුපිට පස්
සත්ත්ව පොහොර
ශාක පත්‍ර
මේරූ ශාක කොටස්
1.5m

ද්‍රව්‍ය ඇසිරීම

ආවරණය කිරිම

වල ක්‍රමය

.

5.කොම්පෝස්ට් ගොඩේ තෙතමනය පවත්වා ගැනීම

•කොම්පෝස්ට් ගොඩ හොඳින් ජීර්ණය වීමට ප්‍රමාණවත් පරිදි තෙතමනයක් තිබිය යුතුයි.

කොම්පෝස්ට් ගොඩේ අභ්‍යන්තර තත්වය නිරික්ෂණයට
කොම්පෝස්ට් ගොඩ සැකසීමේ දී එය තුලට උල් කල ලියක් ඇතුළු කර තබයි.
•දින කිහිපයකට වරක් එම ලීය එළියට ගෙන බලයි. ලීයේ තත්ත්වය අනුව

උණුසුම් නම් - කොම්පෝස්ට් ජීර්ණ ක්‍රියාවලිය හොඳින් සිදුවේ.
වියලි නම් -කොම්පෝස්ට් ගොඩ තුල ජලය ප්‍රමාණවත් නැත.ජලය එකතු කළ යුතුය.
සුදුපුස් ඇත්නම් - කොම්පෝස්ට් ජීර්ණ ක්‍රියාවලිය හොඳින් සිදු නොවේ.

6. කොම්පෝස්ට් ගොඩ පෙරලීම

කොම්පෝස්ට් ජීර්ණ ක්‍රියාවලිය හොදින් සිදුවීමට නියමිත කාලාන්තර වලින් කොම්පෝස්ට් ගොඩ පෙරලීම කල යුතුය.

පළමු පෙරලීම - ගොඩ ගසා මාසයකට පසුව

දෙවන පෙරලීම - පළමු පෙරලීමෙන් මාසයකට පසුව
(ගොඩ ගසා මාස දෙකකට පසුව)

තෙවන පෙරලීම - දෙවන පෙරලීමෙන් මාසයකට පසුව
(ගොඩ ගසා මාස තුනකට පසුව)

මාස තුනකට පසුව කොම්පෝස්ට් භාවිතයට ගත හැක

පෙරලීම

ගොඩ ක්‍රමය ට කොම්පෝස්ට් සෑදීම

- සැකසීම ,පෙරලීම පහසුයි.
- මනා වාතාශ්‍රයක් ලැබෙන නිසා ජීර්ණ ක්‍රියාවලිය හොඳින් සිදුවේ.
- තෙතමනය හොඳින් පවත්වා ගත හැක .
- සැකසුනු කොම්පෝස්ට් වල දුගඳක් නැත.
- පනුවන් ඇති නොවේ.

වල ක්‍රමය ට කොම්පෝස්ට් සෑදීම

- ජලය වාෂ්පීකරණය අඩුයි.
- වලක් සැකසීමට අමතර ශ්‍රමයක් හා මුදල ක් වැයවේ.
- වාතාශ්‍රය අඩුයි.
- වර්ෂා ජලය වල තුල එකතු විය හැක .
- පෙරලීම අපහසුයි.
- තෙතමනය වැඩිනිසා කොම්පෝස්ට් වල දුගඳක් හා පනුවන් ඇතිවේ.

ජීවකොටු /කෝටුරාමු ක්‍රමය ට කොම්පෝස්ට් සෑදීම

•කුඩා ගෙවතු සඳහා සුදුසු ක්‍රමයකි.

•ග්ලිරිසීඩියා,ඉපිල් ඉපිල් වැනි ශාක වලින් ලබාගත් 2 m පමණ දිග කෝටු 5 cm පරතරයට සිටුවයි .

•උණපටි වැනි ද්‍රව්‍යකින් වටේ රාමුව සකස් කරයි.

•එදිනෙදා ඉවත දමන ශාකමය ද්‍රව්‍ය රාමුව තුලට දමයි.

•තට්ටු ලෙස ගොඩගැසීම ,ආවරණය කිරීම හෝ ගොඩ මිශ්‍ර කිරීමක් සිදු නොකරයි

•දිරාපත්වන කාබනික ද්‍රව්‍ය යටින් පිටතට ගනියි

ජීවකොටු

බැරල් ක්‍රමය ට කොම්පෝස්ට් සෑදීම

•නාගරික ගෙවතු සදහා සුදුසු ක්‍රමයකි.
•විශේෂයෙන් සැකසු කොම්පෝස්ට් බදුනක් හෝ බැරලයක් යොදා ගත හැකිය.
•එදිනෙදා ගෙවත්තෙන් හා මුළුතැන්ගෙයින් ඉවත් ලන කාබනික ද්‍රව්‍ය බැරලය තුලට පුරවයි.
•තට්ටු ලෙස ගොඩගැසීම හෝ ගොඩ මිශ්‍ර කිරීමක් සිදු නොකරයි .
•පියන වසා තැබීමෙන් මැස්සන් බෝවීම පාලනය කල හැකිය.
•පැරණි කොම්පෝස්ට් ස්වල්පයක් එකතු කිරීමෙන් ජීර්ණය ඉක්මන් කර ගත හැකිය.

කාබනික දියර පොහොර

•දියර පොහොර යනු

ශාක පෝෂණය සඳහා පත්‍ර වලට ඉසිනු ලබන පොහොර යි.

•කාබනික දියර පොහොර වර්ග

➢කුකුළු පොහොර හා කොළ පොහොර නිස්සාරකය

➢ගැඩවිල් පණු දියර

➢මත්ස්‍ය තෛලෝද

•සකස් කල දියර පොහොර ජලයේ දියකර තනුක කිරීමෙන් පසුව බෝග වලට යෙදිය යුතුය.

• අනෙකුත් කාබනික පොහොර වලට වඩා ඉක්මනින් ශාක වලට උරා ගනියි.

කුකුළු පොහොර හා කොළ පොහොර නිස්සාරකය



අවශ්‍ය ද්‍රව්‍ය -

කුකුළු පොහොර තාච්චි 1

ශාක පත්‍ර

ප්ලස්ටික් බැරලයක් 200 *l*

සවිවර බෑග් 2

ජලය

ක්‍රමය සවිවර බෑග් දෙකට වෙනවෙනම කුකුල් පොහොර හා කුඩාවට කැපූ ශාක පත්‍ර පුරවා ගනියි.

(බෑගයෙන් අඩක් පමණ පිරීම ප්‍රමාණවත්ය .)

කෝටුවක දෙපස බෑග් දෙක රදවයි.

බෑග් දෙක බැරලය තුලට වැටෙන ලෙස කෝටුව බැරලයේ කට මත රදවයි.

බෑග් වැසී යන පමනට ජලය යොදයි.

දින කිහිපයකට වරක් බෑග් සෙලවීම කල යුතුය.

සති 3 ට පසුව ප්‍රයෝජනයට ගත හැකිය

කාබනික පොහොර භාවිතයේ වාසි

•ශාක පෝෂණය සඳහා අවශ්‍ය සියලුම පෝෂක අඩංගු නිසා පූර්ණ පොහොරකි .

•දිගු කලක් පසේ රැඳී පවතී.

•පාංශු ව්‍යුහය දියුණු කරයි.

•පසේ කැටායන හුවමාරු ධාරිතාවය වැඩි කරයි.

•පසේ ජල අවශෝෂණ ධාරිතාවය වැඩිවේ.

•පාංශු ක්ෂුද්‍ර ජීවි ගහනය වැඩි කරයි.

•පාංශු pH අගය නොවෙනස්ව තබා ගනියි

කාබනික පොහොර භාවිතයේ වාසි හා අවාසි

- පෝෂක ප්‍රතිශතය අඩු බැවින් විශාල ප්‍රමාණ වලින් යෙදිය යුතුය .
- සකසා ගැනීම අපහසුය.
- ප්‍රවාහනය හා ගබඩා කර තැබීම අපහසුය.
- සැකසීමට හා යෙදීමට අවශ්‍ය කම්කරු වියදම වැඩිය.
- ඌනතා සඳහා යෙදිය නොහැක

රසායනික පොහොර

කර්මාන්තශාලා තුල රසායනික ද්‍රව්‍ය කෘත්‍රිමව නිෂ්පාදනය කරන පොහොර රසායනික පොහොර යි.

රසායනික පොහොර වර්ග හා ඒවායේ භෞතික ලක්ෂණ

යූරියා

- සුදු පාටයි.
- ගෝලාකාර ස්ඵටිකය.
- ජල ද්‍රව්‍යතාවය ඉහල මට්ටමක ඇත .
- ජලයේ දියවන විට ජලය සිසිල් වේ.
- වායුගෝලීය ජලවාෂ්ප වලින් පවා දියවේ
- නයිට්‍රජන් 46% අඩංගු වේ

ඇමෝනියම් සල්ෆේට්

- සුදු පාටයි.
- කුඩා ස්ඵටික වේ.
- ජලයේ පහසුවෙන් දියවේ.
- ජලයේ දියවන විට ජලය සිසිල් වේ.
- නයිට්‍රජන් 20% අඩංගු වේ.

රොක් පොස්පේට්

- ලා දුඹුරු පාටයි.
- සියුම් කුඩු වැනි ස්ඵටික
- ජලයේ දිය නොවේ.
- 27% -30% පොස්පරස් අඩංගු වේ.

ත්‍රිත්ව සුපර් පොස්පේට්

- ලා අළු පාටයි.
- ජලයේ මදක් දිය වේ.
- පොස්පරස් 45% අඩංගු වේ.

මියුරියේට් ඔෆ් පොටෑෂ්

- රතු දුඹුරු පාටයි.
- කුඩා ස්ඵටික
- ජලයේ හොඳින් දිය වේ.
- පොටෑසියම් 60% අඩංගු වේ.

සල්ෆේට් ඔෆ් පොටෑෂ්

- සුදු පාටයි.
- කුඩා ස්ඵටික
- ජලයේ හොඳින් දිය වේ.
- පොටෑසියම් 48 % අඩංගු වේ.

රසායනික පොහොර වෙළදපොළ තුල ලබා ගත හැකි ආකාර දෙකකි.

- 1.අමිශ්‍ර පොහොර (සෘජු පොහොර)

ප්‍රධාන පෝෂක තුනෙන් එකක් පමණක් අඩංගු පොහොර

අමිශ්‍ර පොහොර භාවිතයේ වාසි

1බෝගයේ අවශ්‍යතාවය අනුව යෙදිය හැකිය.

2 මිශ්‍ර පොහොර වලට වලට වඩා මිල අඩුයි.
3 පසේ තත්වය අනුව පොහොර සංයුතිය වෙනස් කල හැකිය.
4 පොහොර මිශ්‍රණ සකස් කිරීමේදී වෙනත් අපද්‍රව්‍ය කලවම් වියහැකිය .අමිශ්‍ර පොහොර වල එවැනි ගැටළු නැත .

•2.මිශ්‍ර පොහොර

ප්‍රධාන පෝෂක එකකට වඩා අඩංගු පොහොර

මිශ්‍ර පොහොර ආකාර දෙකකි.

1.පූර්ණ පොහොර මිශ්‍රණ

ප්‍රධාන පෝෂක තුනම අඩංගු පොහොර මිශ්‍රණ

උදා- එළවලු පොහොර

2. අර්ධ පොහොර මිශ්‍රණ

ප්‍රධාන පෝෂක තුනෙන් දෙකක් පමණක් අඩංගු පොහොර මිශ්‍රණ

උදා -වී වගාවේ TDM පොහොර

රසායනික පොහොර භාවිතයේ වාසි

- ශාක වලට ඉක්මනින් අවශෝෂණය වේ.
- ශාක ඌනතා වලට අනුව අදාළ පෝෂකය පමණක් ලබා දිය හැකිය.
- වගා බිමට යෙදීම පහසුයි .
- ප්‍රවාහනය හා ගබඩා කිරීම පහසුයි.

රසායනික පොහොර භාවිතයේ අවාසි

- පාංශු pH අගය වෙනස් විය හැකිය.
- නිර්දේශිත ප්‍රමාණයට වඩා දැමූ විට ශාක මියයයි .
- කාබනික පොහොර වලට වඩා මිල වැඩියි.
- නියමිත පිළිවෙත් අනුගමනය නොකලොත් වාෂ්පීකරණය හා ක්ෂරණය මගින් පෝෂක හානි වේ.
- පරිසර දූෂණය වේ.
- පාංශු ජීවීන්ට අහිතකරයි.
- පස තද වේ.

බෝගවලට පොහොර යෙදීම

❖යොදන අවස්ථාව

1.මුලික පොහොර යෙදීම
බෝගය සිටුවීමට පෙර බිම් සකසන අවස්ථාවේදී පොහොර යෙදීම .
කාබනික පොහොර බොහෝ විට මෙම අවස්ථාවේ දී යොදයි.

රසායනික පොහොර යෙදීම

කාබනික පොහොර යෙදීම

2.මතුපිට පොහොර යෙදීම

බෝගය සිට වූ පසුව බෝගයට පොහොර යෙදීම

❖පොහොර යොදන ක්‍රමය

1.පසට පොහොර යෙදීම

❑**පොහොර ඉසීම /වැපිරීම**

නියමිත පරතරයට බෝග වගා කර නොමැති වගා බිම් වල හා ඉතා අඩු පරතරයක් සහිතව බෝග වගා කර ඇතිවිට ක්ෂේත්‍රය පුරා ඒකාකාරව විසිරි යන සේ පොහොර ඉසීම කරයි.

උදා -වී වගාවේ

❑පැළ අවට යෙදීම

වැඩි පරතරයකින් පැළ සිටුවා ඇතිවිට පැළය වටා හෝ අඩ කවයක් ලෙස පොහොර යොදයි.

උදා-රබර්,පොල්,පළතුරු බෝග

❑පේලියට යෙදීම

පේලි ලෙස බෝග වගාකර ඇතිවිට පේලි දෙකක් අතර පොහොර යොදයි.
උදා -අන්නාසි ,බඩ ඉරිගු



- වගාබිමේ තැනින් තැන වලවල් සාදා යෙදීම

වඩා විශාලව වැඩෙන බෝග සඳහා මෙලෙස පොහොර යෙදීම සිදුකරයි.

උදා -පලතුරු

2.ජල සම්පාදනයේ දී ජලයේ දියකර යෙදීම

බින්දු ජල සම්පාදනය ඉසින ජල සම්පාදනය වැනි ජල සම්පාදන ක්‍රම යොදා ගන්නා ඕනෑම බෝගයකට යොදා ගත හැකිය

3.පත්‍ර ඉස්නාවක් ලෙස යෙදීම

පොහොර නිර්දේශිත ජල පරිමාවක දිය කර ඉසින යන්ත්‍රයක් භාවිතයෙන් ශාක පත්‍ර තෙමී යන ලෙස යොදයි.

❖වගාවේ අවස්ථාව අනුව

කෙටි කාලින බෝග	දිගුකාලින බෝග
• මූලික හා මතුපිට පොහොර ලෙස කාබනික පොහොර යොදයි. • මූලික පොහොර ලෙස රසායනික පොහොර යොදන විට N ,P,K අඩංගු මිශ්‍රණයක් යොදයි . • පොස්පරස් අවශ්‍යතාවය සඳහා ත්‍රිත්ව සුපර් පොස්පේට් භාවිත කරයි. • බෝගය සඳහා නිර්දේශිත පොස්පරස් ප්‍රමාණය මූලික පොහොර ලෙස ලබා දෙයි. • මතුපිට පොහොර ලෙස N හා K අඩංගු පොහොර යොදයි. .	• මූලික හා මතුපිට පොහොර ලෙස කාබනික පොහොර යොදයි. • මූලික පොහොර ලෙස රසායනික පොහොර යොදන විට N ,P,K අඩංගු මිශ්‍රණයක් යොදයි. • පොස්පරස් අවශ්‍යතාවය සඳහා ත්‍රිත්ව සුපර් පොස්පේට් මෙන්ම රොක් පොස්පේට් ද භාවිත කරයි. • බෝගය සඳහා නිර්දේශිත පොස්පරස් ප්‍රමාණය වරින් වර ලබා දෙයි. • මතුපිට පොහොර ලෙස N , P ,K අඩංගු පොහොර යොදයි. • බෝගය වර්ධනය වන කාලයේ වැඩි N ප්‍රමාණයක් හා පල දරන විට වැඩි K ප්‍රමාණයක් ලබාදිය යුතුය

පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහල නැංවීම

පසට යොදන පොහොර
බෝග විසින් ප්‍රයෝජනයට
ගැනීමේ හැකියාව පොහොර භාවිත
කාර්යක්ෂමතාවය ලෙස හඳුන්වයි.

පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

1 .පසේ අඩංගු පෝෂක ප්‍රමාණය පරික්ෂා කිරිම

බෝගයට පොහොර යෙදීමට පෙර පසේ අඩංගු පෝෂක ප්‍රමාණය පරික්ෂා කර බැලිය යුතුයි.
පසේ හිග පෝෂක පමණක ලබාදිම කරයි.

2.දේශගුණික තත්වය

අධික වර්ෂා කාලයේ පොහොර යෙදු විට දැඩි ප්‍රමාණයක් සේදියයි.
නියං තත්ත්ව පවතින විට පෝෂක අවශෝෂණය අපහසුය.

3.පසේ තෙතමනය

පස යන්තමින් තෙත්ව ඇතිවිට පොහොර කාර්යක්ෂමතාවය ඉහල යයි.

4.වල්පැල පාලනය

.වල්පැල පෝෂක සඳහා බෝගය සමග තරග කරන නිසා බෝගයේ පොහොර කාර්යක්ෂමතාවය අඩුවේ.පොහොර දීමට පෙර වගාබිමේ ඇති වල්පැල ඉවත් කල යුතුය.

5.සුදුසු පොහොර යෙදීමේ ක්‍රමයක් භාවිත කිරීම

වගා කර ඇති බෝගය ,වගා පරතරය ,ජල සම්පාදනක්‍රමය ,වගාබිමේ ප්‍රමාණය ආදිය සලකා බලා පොහොර යෙදීම කල යුතුය .

6.පොහොර ප්‍රමාණය වරින්වර යෙදීම

බහු වාර්ෂික බෝග සදහා නිර්දේශිත පොහොර ප්‍රමාණය එකවර නොයොදා වාර කිහිපයක් කොටස් වශයෙන් යෙදීම.

7.ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය අනුව පොහොර යෙදීම

පළමුව පසට කාබනික පොහොර යොදා පසේ භෞතික ,රසායනික හා ජෛව ලක්ෂණ දියුණු වූ පසුව රසායනික පොහොර යොදයි .

ශාක පෝෂක කළමනාකරණය (IPNS)

මෙම ක්‍රමය පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහල නැංවීමට වඩාත්ම සුදුසු යැයි පිළිගනියි.

- කාබනික පොහොර වල අඩු පෝෂක ප්‍රතිශතයක් ඇති නිසා ඉතා විශාල ප්‍රමාණයක් දීමට සිදුවේ.
- කාබනික කලිල නිසා පසේ පෝෂක රදවා ගැනීම වැඩිවේ.
- පසේ කැටායන හුවමාරුව වැඩි කරයි.
- රසායනික පොහොර වල පෝෂක ප්‍රතිශතය ඉහලය.
- කාබනික කලිල මගින් පෝෂක රදවාගෙන අවශ්‍ය විට නිදහස් කරයි.

ස්තුතියි.